# සේව්‍ය සේවක සබඳතාව..

10 ශ්‍රේණිය


සැකසුම හා ඉදිරිපත් කිරීම

ආර්.එම්.සුරංග රත්නසේකර මයා
කෑ/දෙහි/ මුහන්දිරම් විද්‍යාලය
දැරණියගල

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා


සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

surangarathnasekara83@gmail.com
දු.ක : 071-5423607


බුදුසරණායි

# සිඟාලෝවාද සූත්‍රය


Sigālovāda Sutta
A Practical way for an Ideal Life
Supplementary Reader for National, International and
Dhamma Schools, Teachers and Parents
Edited and Compiled by
Winitha Jinasena

# සිඟාලෝවාද සූත්‍රයේ ඉතිහාසය

- අප මහා බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ සිටින කල්හි එක් දිනක් මහාමාර්ගයේ ගමන් කරන අවස්ථාවක සිගාල නම් ගෘහපතියෙකු දිශා හයකට නමස්කාර කරමින් සිටියේය.
- කුමක් කරම්දැයි විමසූ කල්හි තමපියා කියාදුන් පරිදි සදිසා නමස්කාර කරන බව සිගාල ගෘහපතියා බුදුරජාණන් වහන්සේට පිළිතුරු දුනි.
- එවිට බුදුරජාණන් වහන්සේ මිත්‍යාදෘෂ්ටිකව සදිසා නමස්කාර කරමින් සිටි සිගාල වෙත නියමාකාරයෙන් සදිසා නමස්කාරය කරන ආකාරය දේශනා කළ සේක.

මාතා පිතා දිශා පුබ්බා - ආචාරියා දක්ඛිණා දිශා

පුත්ත දාරා දිශා පච්චා - මිත්තා මච්චාච උත්තරා

දාසකම්ම කාරා හෙට්ඨා - උද්ධන් සමන බ්‍රාහ්මණා එතා දිශා

නමස්සෙයිය - අලමත්තෝ කුලේ ගිහි

# සදිසා නමස්කාරය

| | | |
|---|---|---|
| නැගෙනහිර දිශාව | - | මවුපිය දූදරු |
| බටහිර දිශාව | - | ස්වාමි භාර්යා |
| උතුරු දිශාව | - | හිත මිතුරන් |
| දකුණු දිශාව | - | ගුරු ශිෂ්‍ය |
| උඩ දිශාව | - | පැවිදි ගිහි |
| යට දිශාව | - | සේව්‍ය සේවක |

# දාස කම්ම කාරා හෙට්ඨා යට දිශාව : සේවය - සේවක



# ස්වාමින්ගෙන් සේවකයන්ට ඉටු විය යුතු යුතුකම්

1. ශාරීරිකව කළ හැකි වැඩ පමණක් දීම.

   එසේ නොවුනහොත් සේවකයෝ නපුරු වෙති.  ස්වාමියාට නොකැමතිව ද්වේශ කරති.

2. සුදුසු පරිදි ආහාර හා වැටුප් දීම.

   නිසි පරිදි වැටුප් නොලැබෙන්නේ නම් සේවකයෝ කාර්යක්ෂමව වැඩ නොකරන අතර ව්‍යාපාරය බිඳ වැටේ.. මන්ද ඔවුන් තෘප්තිමත් නොවන බැවිනි.

## 3. සෞඛය පහසුකම් සපයා දීම.

නිරෝගී බව උතුම්ම සැපත බව බුදුදහමේද දක්වා ඇති අතර නිරෝගී නොවන පුද්ගලයන්ගෙන් ලබා ගත හැකි ඵලදායිතාවය අඩු වේ. එබැවින් සේවකයන් නිරෝගී වීම ස්වාමීන්ගේ දියුණුවට හේතුවන කරුණකි.

## 4. මිහිරි ආහාර පාන ආදිය සපයා දීම.

එවන් සුළු සැලකීමකින් පවා සේවක හිත දිනා ගැනීම සේවායන්ට වැදගත්වන අතර එවිට සේවකන් ස්වාමින් වෙත පවතින පැහැදීම වැඩිවේ. එවිට ඉහල යන්නේ සේවායාගේ ආදායමයි.

## 5. සුදුසු අවස්ථාවේදී විවේකය දීම.

නිදහස මිනිසාට අත්‍යවශ්‍ය කරුණක් වන අතර යන්ත්‍ර සුත්‍ර වලට පවා විවේකය අවශ්‍ය වේ. එබැවින් නිසි පරිදි නිවාඩු ලබා දීම මඟින් සේවකයන්ගේ ආකර්ෂණය වැඩි වන අතර එවිට සේවා ස්ථානයට ඇති බැදීම ඉහල යයි.

# සේවකයන්ගෙන් ස්වාමින්ට ඉටු විය යුතු යුතුකම්

1. ස්වාමියාට පළමුව පිබිදීම.

අතීත සමාජයේ ගෘහාෂිත සේවය සමඟ බැඳී පැවතුනු මෙම යුතුකම් වර්තමාන වැඩ ලෝකයේ මෙය ප්‍රායෝගික නොමැති වුවද වර්තමානයටද අදාළ කරගත හැක්කේ ස්වාමියාට පෙර සැම කාර්යයක්ම සොයා බලා ඉටු කිරීම සේවකයන්ගේ යුතුකමක් කර ගැනීමෙනි.

2. ස්වාමියාට පසුව නිදා ගැනීම.

මින් අදහස් කරන්නේ හැකි සෑම අවස්ථාවකදීම ස්වාමියා නොමැති විට පවා සියලු කරයුතු සොයා බලා ඉටු කිරීමයි.

## 3. ස්වාමියා දුන් දේ පමණක් ගැනීම.

සොරකම් වංචා වලින් තොරව අවංකව සේවය කිරීම මින් අදහස් වන අතර ලද දෙයින් සතුටු වීමත් මින් අදහස් වේ.

## 4. වැඩ කටයුතු ඉතා හොඳින් ඉටු කිරීම.

තමන් ගන්නා වැටුපට සරිලන පරිදි හෝ ඊටත් වඩා හොඳින් තම කාර්යයන් ඉටු කිරීම හොඳ සේවකයෙකුගේ ගුණාංගයකි.

## 5. ස්වාමියාගේ ගුණ වර්ණනා කිරීම.

තම සේවා ස්ථානයට අපකීර්තියක් වන දේ ප්‍රකාශ කිරීමෙන් හෝ නුසුදුසු ස්ථානයන්හිදී සේවා ස්ථානයේ වැරදි විවේචනය කිරීම නොකළ යුතු බව මින් අදහස් වේ.

# යුතුකම් ඉටු නොවුනහොත් ......

සේවකයන් විසින්,






# ස්වාමින් විසින් ,





# ස්තූතියි...